# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1977/16 - 2016 ජූලි මස 27 වැනි බදාදා - 2016.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 13/2014

### (107 අධිකාරය වූ) නොතාරිස් ආඥාපනත

(107 අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ 8 වැනි වගන්තිය සමග කියවිය යුතු 7 වැනි වගන්තිය යටතේ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වජිර අබේවර්ධන,
ස්වදේශ කටයුතු අමාත්‍ය.

2016 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (මෙහි මින් මතු ''ආඥාපනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) කලින් කල සංශෝධිත (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ 1 වන උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(අ) එහි ''අ'' කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් ''අ'' කොටස ආදේශ කිරීමෙන්

''

(7 වන වගන්තිය)

අ

7 වන වගන්තිය යටතේ ප්‍රතිඥාත ආධුනිකයන් ඇතුළත් කර ගැනීම සඳහා වන නියෝග

1 (1) නොතාරිස් ධූරයට සුදුසුකම් ලබා ගැනීමේ අභිප්‍රායෙන් ප්‍රතිඥාත ආධුනිකයකු වීමට අදහස් කරන සෑම තැනැත්තෙකුට ම තරග පරීක්ෂණයකට පෙනී සිටිය යුතු බවට නියම කළ යුතු ය.

(2) තරග පරීක්ෂණය සඳහා පෙනී සිටීමට ඉල්ලුම් කිරීමට අදහස් කරන සෑම තැනැත්තකු ම (3) වන ඡේදයේ සඳහන් අධ්‍යාපනික සුදුසුකම් සහ වෙනත් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(3) (අ) අධ්‍යාපන සුදුසුකම් :-

අපේක්ෂකයා -

(i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරක ට නොවැඩි වාර ගණනක දී ගණිතය, ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සමත් වී තිබිය යුතු අතර එම විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය ; සහ

(ii) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබිය යුතු ය.

(ආ) වෙනත් සුදුසුකම් :-

අපේක්ෂකයා -

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය ;

(ii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයේ දී වයස අවුරුදු 20 ට නොඅඩු සහ වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය ;

(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය ;

(iv) වෘත්තිය රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය ;

(v) අධිකරණයක් මගින් යම් සාපරාධී වරදකට වරදකරු කරනු ලැබ නොතිබිය යුතු ය.

2. 1 (3) ඡේදයේ සඳහන් සුදුසුකම් ඇත්තා වූ ද තරඟ පරීක්ෂණයට පෙනී සිටීමට අදහස් කරන්නා වූ ද සෑම තැනැත්තෙක් ම ආඥාපනතේ දෙවන උපලේඛනයේ "අ1" ආකෘති පත්‍රයට සාරානුකූල වූ ඉල්ලුම්පත්‍රයක් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. සෑම ඉල්ලුම්පත්‍රයක් ම අපේක්ෂකයා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් සහ ඔහුගේ අත් අකුරින් සකස් කළ යුතු ය.

4. (1) තරඟ පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබිය යුතු ය.

(2) විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණයේ ප්‍රතිඵල අපේක්ෂකයා විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය පදනම් කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමේ කුසලතා අනුපිළිවෙලට දක්වමින් වාර්තාවක් මෙහි දෙවන උපලේඛනයේ "අ1" ආකෘතියට අනුව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත එවිය යුතු ය.

5. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අදාළ වාර්තාව ස්වදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

6. (1) වාර්තාව ලැබීමෙන් පසු, එම වාර්තාවේ නම් සඳහන් අපේක්ෂකයන් අතුරෙන් අවසාන ජන සංගණනය පදනම් කරගෙන ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා බඳවා ගනු ලබන ප්‍රතිඥාත ආධුනිකයන් සංඛ්‍යාව අමාත්‍යවරයා විසින් තීරණය කළ යුතු ය.

(2) එසේ තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

(3) තරඟ පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අවශ්‍ය අපේක්ෂකයන් සංඛ්‍යාව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තෝරා ඒ එක් එක් අපේක්ෂකයාට ප්‍රතිඥාත ආධුනිකයකු වශයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකුට සේවය කිරීමට බලපත්‍රයක් ලබා දිය යුතු ය.

7. බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ සෑම අපේක්ෂකයකු විසින් ම ඒ බලපත්‍රය නිකුත් කළ දිනයේ සිට මාස හයක් ඇතුළත -

(අ) බලපත්‍රයේ නම සඳහන් නීතිඥවරයා සමග ගිවිසුම් ප්‍රතිඥාවලට ඇතුළත් විය යුතු ය ; සහ

(ආ) ඒ ගිවිසුම් ප්‍රතිඥාවල පිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

8. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් යම් තැනැත්තෙකු බලපත්‍රයක් ලබා ඇත්නම් මිස, ඔහු ප්‍රතිඥාත ආධුනිකයෙකු නොවිය යුතු ය.

9. සෑම ප්‍රතිඥාත ආධුනිකයෙකු ම අවුරුදු දෙකකට නොඅඩු කාලයක් තම ගිවිසුම් ප්‍රතිඥා අනුව සේවය කළ යුතු අතර ඒ කාලය තුළ නොතාරිස්වරයෙකුට අයත් කටයුතු හැදෑරීම හැර, අන් කිසිදු රක්ෂාවක නියුක්ත වීම හෝ නිරත වීම නොකළ යුතු ය.

10. ප්‍රතිඥාත ආධුනිකයා සේවය කරන නීතිඥවරයා එම ආධුනිකයා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් වෘත්තියෙහි යෙදෙන නොතාරිස්වරයෙකු නොවේ නම් ඒ නීතිඥවරයා වෙත ආධුනිකයකු වශයෙන් අවුරුදු එකක් ද තමා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් වෘත්තියෙහි යෙදෙන නොතාරිස්වරයකුගේ කාර්යාලයෙහි ආධුනිකයෙකු වශයෙන් ඉන්පසු අවුරුද්දක් ද ඔහු සේවය කළ යුතු අතර එසේ කිරීමට සිදු වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අලුත් බලපත්‍රයක් ලබා ගෙන ඒ බලපත්‍රයෙහි නම් සඳහන් නොතාරිස්වරයා සමග අලුත් ගිවිසුම් ප්‍රතිඥාවලට ඇතුලත් විය යුතු ය. ඒ ගිවිසුම් ප්‍රතිඥාවල පිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

11. යම් තැනැත්තකු ප්‍රතිඥාත ආධුනිකයකු වශයෙන් බැඳුණු නීතිඥවරයා මියගිය විට හෝ ඒ ප්‍රතිඥාවලට ඇතුලත් වූ කාලයෙහි වෘත්තියෙහි යෙදෙමින් සිටි දිස්ත්‍රික්කයෙහි වෘත්තියෙහි යෙදීම ඔහු නතර කළ විට හෝ වෙනත් පිළිගත හැකි හා ප්‍රමාණවත් හේතුවක් පිට ඒ ප්‍රතිඥාත ආධුනිකයාට අන් කිසි නීතිඥවරයෙකු වෙත ඔහුගේ ගිවිසුම් ප්‍රතිඥා හරවා ගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අවසර දිය හැකි ය. එවැනි අවස්ථාවක දී ඒ හරවා ගැනීම ගැන නොතකා මුල් ගිවිසුම් ප්‍රතිඥා යටතේ ඔහු සේවය කර තිබිය හැකි කාලය, ඔහුගේ ආධුනිකත්ව කාල සීමාවේ කොටසක් ලෙස සැලකිය යුතු ය.

12. 9 වන සහ 10 වන නියෝග යටතේ, සේවයට සාක්ෂි වශයෙන් එක් එක් වර්ෂයේ මාර්තු මස තිස්එක් වන දින, ජූනි මස තිස්වන දින, සැප්තැම්බර් මස තිස්වන දින හා දෙසැම්බර් මස තිස්එක් වන දින හෝ ඒ ඒ දිනට පෙර තමා සේවය කරන නීතිඥගෙන් හෝ නොතාරිස්ගෙන් ලබා ගත් මේ ආඥාපනතෙහි දෙවන උපලේඛනයෙහි දැක්වෙන "ආ" ආකෘතියෙහි වූ සහතිකයක් ප්‍රතිඥාත ආධුනිකයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

13. 12 වන නියෝගයෙහි සඳහන් සහතිකය සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි කරුණු දක්වන ලද නම් මිස එසේ අපොහොසත්ව සිටි කාලය ඔහුගේ ආධුනිකත්ව කාල සීමාවේ කොටසක් ලෙස ගණන් ගැනීමට ඔහුට ඉඩ නොදිය යුතු ය ; සහ

(ආ) මෙහි "ආ" කොටසේ දෙවන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"2. 1 වන නියෝගයේ සඳහන් ඉල්ලීමක් කිරීමට අදහස් කරන සෑම ප්‍රතිඥාත ආධුනිකයකු විසින්ම ඒ ඉල්ලීම කිරීමට තමා අදහස් කරන බවට භාෂා තුනෙන් ම වූ දැන්වීමක් තමා පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ මහාධිකරණයේ යම් ප්‍රකට කොටසක අලවනු ලැබීමට ද යටත් පිරිසෙයින් එක් වරක්වත් භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයෙහි ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් පළවන දේශීය ප්‍රවෘත්ති පත්‍ර තුනක ද ප්‍රසිද්ධ කරනු ලැබීමට සැලැස්විය යුතු ය. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කිරීමට අවම වශයෙන් මසකට පෙර ඒ දැන්වීම ප්‍රසිද්ධ කළ යුතු ය." ;

2. ආඥාපනතේ කලින් කළ සංශෝධිත දෙවන උපලේඛනය එහි "අ 1" ආකෘති පත්‍රය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් "අ 1" ආකෘති පත්‍රය ආදේශ කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

*(පළමුවන උපලේඛනය 2 වන නියෝගය)*

"අ 1" ආකෘති පත්‍රය

**ප්‍රතිඥාත ආධුනිකයන් තෝරා ගැනීම සඳහා වූ තරඟ පරීක්ෂණයට පෙනී සිටීමේ අවසරය සඳහා වූ ඉල්ලීම**

දිනය .........................

රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතටය,
ප්‍රිය මහත්මයාණෙනි,

1. නොතාරිස් ධූරයට සුදුසුකම් ලබා ගැනීමේ අරමුණ ඇතිව ප්‍රතිඥාත ආධුනිකයන් තෝරා ගැනීම සඳහා .................... දින පවත්වනු ලබන තරඟ පරීක්ෂණයට ඇතුළත් කරගනු ලැබීම පිණිස මෙයින් ඉල්ලුම් කර සිටිමි.

2. සම්පූර්ණ නම :

3. පෞද්ගලික ලිපිනය :

4. දිස්ත්‍රික්කය :

5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

6. පරීක්ෂණය ආරම්භ වන දිනයේ දී මාගේ වයස අවුරුදු 20 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි වන අතර මාගේ උප්පැන්න සහතිකය (හෝ මාගේ වයස ඔප්පු කිරීමේ සත්‍ය සාක්ෂය වන වෙනත් ලේඛනයක්) (අ) යනුවෙන් ලකුණු කර මීට අමුණා ඇත.

7. ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ .......................................... මහතා යටතේ ප්‍රතිඥාත ආධුනිකයකු වශයෙන් සේවය කිරීමට අදහස් කරමි.

8. වෘත්තියේ නියැලීමට මා අදහස් කරන අධිකරණ කලාපය සහ භාෂාව පිළිවෙලින් ................................ (කලාපය) සහ ............................. (භාෂාව) වේ.

ප්‍රතිඥාත ආධුනිකයන් තෝරා ගැනීම සඳහා වූ තරඟ පරීක්ෂණයට පෙනී සිටීමට මට අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

....................................
ඉල්ලුම්කරුගේ අත්සන."

08 - 232

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.